# වලාකුළු බැමි




සුබිත එස්. බණ්ඩාර

# වලාකුළු බැමි

## කාව්‍ය සංග්‍රහය

සුබිත එස්. බණ්ඩාර

- වලාකුළු බැමි

- සුභිත එස්. බණ්ඩාර

- පිටකවරය සහ පරිගණක අක්ෂර
  O.S.B වී බැද්ද

- ISBN 978 - 624 - 208 - 13



15A විහාර පාර
මීගම්මන
වත්තේගම

071-3109033
075-7721620

# පිදුම

නෙතු පියෙන හැම රෑම සිහිනයෙන් සිහිනයට
නුඹ ඇවිත් කියනවා කතාවක් මගෙ කනට
ඒ කතා කවි වෙලා කාලයෙන් කාලයට
දෝතින්ම පිළිගන්න මේ පොතම මගෙ දුවට

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාජෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඑලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයප්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක්‍ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි. **2023** සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින්

ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර – විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර
2023.11. 01

**වලාකුළු බැම් ගැන....**

කවි පොතක් ලියන්න අදහසක් නොතිබුණත් විවිධ අවස්තාවලදී සමාජ මාධ්‍ය හරහා නිර්මාණ කිරීමට මම පුරුදු වෙලා හිටියා. ඒ අතර තුර මහමායා බාලිකා විද්‍යාලයේ ගුරුවරයෙක් වෙලා ආව මුල් කාලයේදීම සෙනවිරත්න සර් ඇරැගොඩ මැඩම් වගේ මගේ කවි දැකපු කිහිප දෙනෙක් කවිපොතක් ලියමු කිව්වත් ඒකට අවස්තාවක් ලැබුණේ නැහැ. පස්සේ පොත් කියවන දරුවන්ගේ රුචිය වැඩි කිරීමට E-book ව්‍යාපෘතිය හරහා මේ විදිහට අවස්තාව සැළසුණා.

එහිදී මා විසින් ලියන ලද කවි රාශියක් අතුරින් කිහිපයක් මෙලෙස වලාකුළු බැම් ලෙස ඔබ අතට පත්වෙනවා. මේ නිර්මාණ ඇතුලේ මගේ අත්දැකීම් ළමා කාලය මහනුවර ධර්මරාජ විද්‍යාලයීය පාසල් සමය වගේම පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ ගෙවු සිවු වසරක අත්දැකීම්ද අඩුවැඩි වශයෙන් ඇති. එපමණක් නොව ජීවිතය ගෙවී යද්දී ක්‍රමයෙන් ලබන අත්දැකීම් සමාජයේ දැකපු අහපු කතා ආදරය විප්ලවය අරගලය ගුරු ජීවිතය වැනි බොහෝ දේ මේ කවි ඇතුලේ ඇති.

වලාකුළු බැම් අතර බොහෝ කතා ඇතිබව පොත කියවන කෙනෙක්ට ගැඹුරින් බැලුවොත් පෙනෙයි.

මෙම පොත ඔබ වෙත ලබාදීමට අවස්ථාව සළසා දුන් විදුහල්පතිතුමියටත් නිතරම මා දිරිමත් කරන සහකාර විදුහල්පති ඇරැගොඩ මහත්මියටත් මෙහි නිර්මාපක සෙනවිරත්න මහලේකම් මහත්මාටත් සෑම අවස්ථාවකදීම සහයෝගය ලබාදුන් තනූජා රත්නායක මහත්මියටත් ස්තූතිවන්ත වෙමි.

- සොඳුරු මහමායා මාතා

දස දෙස කිතුගොස පතුරාලා
ඔබෙ නම මුව මුව රැව්දේවා
ජයවේ සැරදේ මවුනි දයාබර
සොඳුරු මහාමායා මාතා

පින්බර දුවරු තෙද ඇති ගුරුවරු
නොමින් පහස ලද ඔබ සෙවනේ
හෙලබස රකිමින් යහගුණ වඩමින්
සුදිලෙනු මැන සිරිලක් දෙරණේ

යුගයෙන් යුගයට නිසිමග පෙන්වන
පහන් තරුව වී දිවි අඹරේ
මහමායාවෙනි සදා රැදෙනු මැන
කප්සුවහස්කල් රන් දෙරණේ

- මළගම

**බුදුපහණ නිවිලා අඳුර වැතිරෙයි නිසොල්මන් රෑ ගොම්මනේ**
**දැවෙන චිතකෙක ගිණි පුපුරු සේ සැලෙයි මා හද ගින්දරේ**
**මරණයේ බිය මෝදු වීගෙන නැගෙන විට මා හදවතේ**
**මෑණියන් දෑ සැතපිලා අද උඩුකුරුව මළ මංචකේ**

**මිනී මල්පෙති සුවඳ පිසගෙන සොහොන් පාළුව ගෙට වැදී**
**බිත්තියේ ඔරලෝසුවේ හඬ මැදියමේ කණිසම වදී**
**පාලු කළුවර ශ්වේත වපණෙන් මළගමේ සිතුවම අඳී**
**නිදා නොනිදා සැලෙන මගෙ හිත ඇඳ වියළ ලග තනි රකී**

**තවත් හෝරා කිහිපයක් ගොස් උදා හිරු කරලියට එයි**
**නවාතැන් ගොප්කොළ තොරණ් මැද ඇගෙ නවාතැන් පොල සැදෙයි**
**ගමේ පන්සල ගමේ සමිතිය විශාඛා ගැන ගුණ වයයි**
**එයින් පසු මේ සියලු දේවල් අහස් තලයට එකතු වෙයි**

● කිරි සිහින

සමනළ තටුවක පාවී පාවී
සිහිනෙන් හිනැහෙන කුමාරියේ
මල් දේදුන්නක සුවසේ නිදියන
රෝස කුසුම මගේ පුංචි දුවේ

නා දළු සුළඟට සෙළවෙන තාලෙට
සිනහ සළන මල් කුමාරියේ
මල් ඔච්ල්ලක නුඹ සතපන්නෙමි
පිණිකැට අතුරා ටිකිරි ලියේ

සුරංගනාවන් දු වටකරගෙන
ගීත ගයනවද සිහින ලොවේ
මම රජවෙන්නම් ටිකිරි සිනා මැද
නුඹෙ සුරතල් දැක පුංචි දුවේ

● නුවරයි මමයි

අතිනත ගිලිහී සිඳී බිඳී ගිය
කඳුළු කතාවට මුවාවෙලා
එදා අපේ පිය සටහන් සඟවා
මේ වැව් ඉවුරම නිසළ වෙලා

දිය රැළි අතරේ විසිරී බොඳවුණ
ඉටු නොවෙනා පෙම් පැතුම වෙලා
හීන් හඬින් ඉකිබින්ද ඔබේ සිත
තව හදවතකට තුරුළු වෙලා

මා ඔබ දෙඅතක වෙන්කළ අරුමය
තනිකම මගෙ ලොව කිරුළ දරා
කාලය ඉගිලී මේ මුළු නුවරම
අද මට වැඩියෙන් මහළු වෙලා

## ● උඩුගං බලා

ඈත නිල්වන් නුබ තලාවේ
ප්‍රේම රංගනයේ
වෙලී එක්වුණු ලිහිණියන් දෙදෙනා
එකිනෙකා වෙන්වී
ප්‍රේමයේ තොටුපොළින් නැව් නැග
නික්මුණා උඩු ගං බලා

ඉල්මහේ නිල් අහස ගැබ්බරවී
විලි රුදාවෙන් කෑ ගසා
නිමක් නැති මේ විශ්වයේ
තිඹිරි ගෙය සොය සොයා
කොයි අතට යම්දෝ

වසන්තේ අග ප්‍රථම ගිම්හානේ
රිකිලි දළු මල් බිම හෙලා
ශේෂවූ කටු ඉපල් පිරිමැද
තුරු හිසේ පිපි අකල් කුසුමක
මුදු සුවඳ පැතුවා

● වළාකුළු බැම්

වළාකුළු බැම් අතර අඳත් මුතු වැස්සේ
අපේ මතක ඉකිබිඳී කාලෙකට පස්සේ
මේ නුවර අහස යට මුළු දවස තිස්සේ
ඇවිදින්න හමුවෙමුද එක කුඩය අස්සේ

- **ජීවිතය**

**නිල් ගුවන් ගැබ අමනාපයෙන්**
**මුතු කඳුළු කැට වගුරා**
**හඩන අහසේ සඳ දකින්නද**
**දෑත බැඳගන බලන් ඉන්නේ**
**කියන් මට අක්කේ**

**සඳ පහන් බොඳවී දියවෙලා**
**නිල් නුවන් තරු මැද සැඟවිලා**
**ශෝක තාපය තුළින් මතුවී**
**ප්‍රේමයේ ගඟ ගලා යයි**
**මැරුණු සඳ එළියේ**

**කුළ ගෙදර වහලය ගිලිහිලා**
**මුතු කඳුළු නෙතු අග බොඳවෙලා**
**නියං කාලය හෙටින් එළඹී**
**ජීවිතේ ගඟ සිඳී යයි**
**අඳුරු මරු කතරේ**

● අවුකන

අකාරුණික ලොව සදාතනික වූ
මෙත් කරුණා බුදු ගුණ මහිමේ
කළා වැවේ මුදු පහස වැදී
සැනහෙයි අවුකන බුදු පිළිමේ

සුසිනිදු පෙන පිඩු නැගී නැගී එයි
කලා වැවේ සුදු දිය රැල්ළේ
මගේ සිතේ දුක නිවී ගලා යයි
සම්බුදු සඳහම් ගඟුළැල්ලේ

ඈතින් මුසුවන සාදු සාදු නද
මගේ සවන් යුග රැව් දෙන්නේ
එදා මෙදා තුර තෙමා තෙමා හද
තවමත් බුදු රැස් විහිදෙන්නේ

● සරසවි ගියෙමි

දහසකින් බැඳි පියල්ලක් මා
ඔබේ නාමෙන් ගුරු පඬුරු කොට
සැදුව මගෙ මාළිගාවේ
කම්බි වටකර යදම් රැහැනින්
මගේ අත්පා බැඳ දමා
සඟවගෙන මා කවුරුදෝ
දිසාපාමොක් ඇඳුරනේ

පාට සෙදුණු සළුව දවටා
බුමුතුරුණු පියවිලි මතින්
අතීතය සක්මන් කරද්දී
අහස ගුගුරා අකුණු පුපුරයි
තක්ෂලාවට ඉහළ ආකාසේ

ගුරුගෙදර කැළිකසල පිරිමැද
උගත් කෙල ශිල්පය සොදින්
හිසින් මිටිකර රැගෙන යද්දී
අහස සිඹිනා මහළු පවුරින්
සිරවෙලා මා ලෙවන් හට රහසේ

- මහඇඳුරු

සරසවි කුරුටු ගීයක ලියවුණු අකුරු
නටබුන් වෙලා හමුවිය අප පෙම සොඳුරු
මහවැලි ගඟට විසිකර දුනු හී සතුරු
වල මැද තනිවෙලා අද මනමේ කුමරු

සරසවි බිමේ පැරදුණු මනමේ කුමරු
සිහිකර හඩා වැලපෙයි කව සඳකිඳුරු
හමුවී මාසේ පෝයක වල ළග අඳුරු
හැඩුවා කුමරි ගැන අසමින් මහ ඇඳුරු

හන්තානටත් ලියවෙයි තව කවි මියුරු
යළි මුණ ගැසේවිද මහවැලි ගං ඉවුරු
නොරිකෝ සංට සයොනාරා කිවු අයුරු
සැඟවිය කඩුව මට නොපෙනිම මහ ඇඳුරු

● මෙදා තිදෙනෙක්

කාලයේ වැලි තලා යටකළ සොඳුරු සැමරුම් ඉකිගසයි
අපේ මතකය දිගේ ඇවිදින මගේ මතකය අසරණයි
දෙනෝ දාහක් නුවන් අතරින් ඔබේ දෙනුවන් සිහිකරයි
එදා දෙදෙනෙක් මෙදා තිදෙනෙක් පැරණි ප්‍රේමය තනිකඩයි

● මදු සාදය

යළි නැගී සිටින්නට වාරු නැති දෙපා ළග
ඔබෙ සුසුම් රාවයෙන් දැවි දැවි අළුව ගිය
අතීතෙක වැළලිලා සැඟව ගිය ආදරය
පණ ගසයි යළි යළිත් තටු සළා ඉගිලෙන්න

විඩාබර ගතේ දුක මල් පැණින් නිවාගන
කටු ඔටුණු ඉවතලා අද දවස නිමාකර
මාවතේ ඇදි ඇදී වාරු නැති දෙපා යුග
සොයා යයි අතීතෙක ඔබේ නලමුදු සුවඳ

නගරයම නිදිගත්ත තරු පිරුණු අහස යට
අපෙ මතක සිනාසෙයි එබි එබී ඔච්චමට
හිස්වෙලා මධු බඳුන් එකින් එක තරඟයට
පාවෙලා ඇදී යයි ඔබ සමග තරුවකට

● මංගල මුදුව

පෝරුව උඩදි පළදා අත පිරි මැද්ද
මැණිකේ අපේ මතකය කොපමණ ඇද්ද
වටපිට බලා රිංගා නොකරම සද්ද
අද මම උකස් තිබ්බා මංගල මුද්ද

● දික්කසාදය

මහමෙරක් සේ සිතින් විද විද දෙපැත්තට ඇදි කඹය
කැඩුණායි
ඔබේ දෑසත් මගේ දෑසත් අතර තුන්වෙනි ඇසක්
රැඳුණායි
අපේ හදවත් සැලෙන හඬ හැර ජූරියේ අන් සැවොම
නිහඬයි
බවෙන් බවයට බැඳී අප ආ සසර ගණුදෙණු අදින්
ඉවරයි

## ● ගිලන් නොවූ සිතුවිලි

ඉදහිට මගෙසිත තනිවෙන මොහොතක
පෙරදින මියගිය ආදරයේ
වියැකුණු දහසක් සිතුවිලි අතරේ
ගිලන් නොවූ එක සිතුවිල්ලක්
වදදෙයි සිතට මගේ

ඔබෙ නෙත් පෙරමග හමුවන මොහොතක
මුනිවත රකිනා හදට මගේ
අගුලු වැටී ඇති ඔබෙ හද අසපුව
හෙමිහිට ඉකිබිඳිනා
ඒ හඬ මට ඇසෙනා

දෙසිතක කඳුළින් බොඳවූ සිහිනය
පාළුව තනිකම රැඳුණු ලොවේ
කඳුළු නැගී එන ඔබෙ නිල් දෙනයන
රහසින් මට කියනා
ඒ දුක කමට දැනෙනා

● අත්හැරුණු ජීවිත

තව දිනක් නිමාවිය ගිලි ගිලී මීවිතේ
වාරු නැති දෙපා යුග ඇදි ඇදී මාවතේ
විරහ ගීයක තනුව මුමුණමින් ගී පොතේ
ඇස් රිදෙන තුරු සොයමි අත් හැරුණු ජීවිතේ

● අතීතය

ගෙවුණු අතීතයේ මියගිය මතකය
වැහැරුණු පිය සටහන් තබමින්
මා පසු පස ලුහු බැඳආවා
අප සැමරුම් රැඳි මේ නගරේ
මා තනිවූ දවසේ

ක්ෂිතිජය සිබිනා මහළු මතකයේ
ගරා වැටෙන පෙම් මැඳුරු දොරින්
එකිනෙක ඇවිදින් මහද දවනවා
මේ නගරේ අප පෙම් සැමරුම්

බැඳගත් අතිනත ගිලිහී ගියදා
වෙන් වූවද අප මේ නගරෙන්
මසිත හැඩූ හැටි අදත් ඇසෙනවා
කාටත් නෑසෙන බිඳුණු හඬින්

● සමුගනිම්

ඔබේ දෙකොපුල් තෙමූ උණුසුම් හාදු වැස්සේ   තෙමි තෙමී
එදා වාගෙම අදත් තනි මග මතක අතරින්   කිමිදෙමී
රෝස දෙකොපුල් එකම සැරයක් ලොවට රහසින්   සිපගමී
යළිත් කිසිදින හමු නොවන්නට ඔබේ ලෝකෙන්   සමු ගමී

● සුදු ගඟ

මිය ඇදුණු ආදරය අතරමග හමුවෙලා
නෙත් අගින් බල බලා පියඹන්න ඉඟිකළා
ජීවිතේ ගිම් නිවන කිරි සිනහ සිහිවෙලා
මම ඔබේ ආදරය සුදු ගඟට විසිකළා

● පැතුම්

සෙංකඩගල නුවර සිල් සුවඳින් නැව්
නාමල් නෙලාගන කිරි මුහුදේ පාවී
දළඳා සමිඳු වැඳුමට තුන් හිත පේවී
ලඟ එන නිකිණි පෝයට එනවද දේවී

● අම්මා

සුපහන් ලොවක හිඳුවන්නට බැති පෙම්මා
මගේ ලොව වෙලා නුඹ විඳි දුක් නැත නිම්මා
මතුයම් දිනෙක පාමුල සම්බුදු සම්මා
නුඹ බුදු වෙයන් මේ භවයෙම අපෙ අම්මා

● ගුරු ගීතය

මේ අයිලයේ කිසිදින අමතක නොවෙනා
පොප්ලර් ගස් අතර මතකය ඉකි බිඳිනා
මුල්පොත කියා දුන් දුයිෂෙන් නුඹ නමිනා
තවමත් හිඳී මග බලමින් අල්තියිනා

● සනාතන මැඳුර යට

ගල්කණු යටත් මල් පිපෙනා    උදෑසන
කඳුළක් ඉකිබිඳී හෙමිහිට         පුරාතන
සරසවි බිමේ මල් මතකය        බදාගන
හඩමුද හමුවෙලා මැඳුරෙදි      සනාතන

● නොරිකො සං

තෝකියෝවට ඉහළ අහසේ දිලෙන තරු වියනක් වගේ
සිනා ගෙනෙනා වසන්තේ අග සකුර මල් පලසක් වගේ
නකපිමාවේ සොහොන් කොත් යට සුබකි මල් අහුරක් වගේ
නොරිකො සං මම කොහේ හිටියත් ජාති ජාතිත් නුඹ මගේ

● සරසවිය හා ජීවිතය

වයසට ගියත් මතු දවසක ගෙන දිරිය
ආයෙත් යන්න ආසම තැන සරසවිය
මා එන තුරුම ඔබ මග බල බල සිටිය
මෙතැනට එන්න පෙන්වයි මග හැරම්ටිය

● මල් කරත්තේ

සීතල සුළං හිරිකඩ මැද  දුරුත්තේ
ඔබ මා සමග පැදගිය මල්  කරත්තේ
අතහැර දැමූ සරසවි බිම  කනත්තේ
පිපිලා මිනී මල් වටකර  වසන්තේ

● පිරිත් නූලෙන් මාළු බෑම

කසාවතකින් සිරුර වහගෙන එදා පුංචිම සන්දියේ
සසුන් ගතවුණු නුඹෙ පොඩි පුතු අදයි දැක්කේ නංගියේ
වටාපතකින් මුහුණ වහගන සරසවිය ළඟ හන්දියේ
පිරිත් නූලෙන් මාළු බානවා විසිරිලා පැන් කෙණ්ඩියේ

● ගම්පෙරලිය සහ නන්දා

කුළ ගෙයි බිත්ති හතරෙම ජයකොඩි බන්දා
කුළ ගර්වය මැද හණමිටි සැප වින්දා
කාලය විසින් ලෝකය පෙරලුව හින්දා
තවමත් තනිකඩද ගම්පෙරලියේ නන්දා

● දතසුද්දා

ගමරට විනාසයි හැමතැන　　බේබද්දෝ
සොල්දර උඩට පැන්නා වගේ　කළවැද්දෝ
දඩයම් කළත් සිල් රකිනවා ගම්　වැද්දෝ
ගිලීමලෙත් ඇත මල්ලියේ දත　සුද්දෝ

● මළගිය ඇත්තෝ

වැස්ස දවසක අහස බල බල තතම් පැදුරක ඇලවෙලා
අපේ මතකය අවදි කෙරුවෙමි අවන්හල් ඇති ගොළුවෙලා
කෝපි සුවඳයි වීදි අතරේ සකුර මල් පෙති විසිරිලා
ඔයා ලඟ නැති තෝකියොවේ නොරිකො සං මම තනිවෙලා

අනෝරා වැහි වැටෙන වැස්සේ පාට සිතුවම් බොඳවෙලා
තෝකියෝවට වඩා සුවිසල් අපේ මතකය දියවෙලා
මහද නොනිදන රැයක රහසින් සිහින අතරින් ඉගිලිලා
එකම සැරයක් ඇවිත් යනවද ඉන්නවා මං මග බලා

ඉමක් නොපෙනෙන ඈත අහසේ වළාකුළු දැන් මැළවිලා
කමකුරා බුදු හිමියනුත් අද සුවැති නින්දක සැතපිලා
ඔබේ උණුසුම් සුවඳ විඳ විඳ කබුකි නැටුමක් බල බලා
නකජිමාවේ සොහොන් කොත් යට යාවි මතකය සැඟවිලා

● මල් වැහි

නුවර පාරෙන් කොළඹ පාරට හැරෙන තැන ලොකු වංගුවේ
අදත් මල් වැහි වැටෙන හවසක මාරා ගහ යට බංකුවේ
වැස්ස හින්දද ඔහුගෙ අතගෙන සෙනග අතරින් රිංගුවේ
දකී කියලද අහක බල බල මුහුණ විතරක් හැංගුවේ

● රඟමඩළ නිහඬයි

කණාමැදිරි එළි නිවෙන ගණ අඳුරු කරුවලේ
අද රැඟුම් බලන්නට තනි තනිව අපි වලේ
හන්තාන සෙවනැල්ල පහන්කණු යට දිලේ
ඔබ ඔතැන මම මෙතැන කෙලෙස අප වෙන් කලේ

● සමුගැනීම

රොබරෝසියා මල් හෙවනේ ඉඳන්
කළ කී කතා අපි ආදරෙන්
සුළඟක් වගේ ඉගිලී ගිහින්
අපි වෙන්ව යමු සොඳුරිය ඉතින්

අප මුණ ගැසුණු සරසවි බිමෙන්
හැර යන්න වෙයි නුඹ මට හෙටින්
පැතූ සියලු දෑ අප අපි නමින්
එක කඳුළකට මුසුවී හොරෙන්

හන්තාන කඳුවැටියට උඩින්
සඳ පායලා අමනාපයෙන්
සමුගනිමු හෙටදින අපි අපෙන්
රොබරෝසියා මල් පෙති උඩින්

● සඳමඩල නුඹමැයි

සඳ මඩල දියවෙවී ඇවිදින්
ශේෂවූ අටවක සඳක් සේ
නතර වී තරු දහක් මිය ගිය
පාළු නිල් අහසේ

අනන්තය දුර පෙනෙන නිල් අහසයි
නිවී දැල්වෙන එකම තනි තරුවයි
කාලයේ ඝණ වළාවෙන් වැසි
සඳමඩල නුඹමයි

මහ ගඟක් සේ ගැලු සඳ කිරණයි
සඳී වියලුණු අඳුරු මරු කතරයි
කාලයේ වැලි තලාවෙන් වැසි
මහපොළොව මමමයි

● යශෝදරා

කපිලවස්තුපුර සැන්දෑ අහසේ
දේදුන්නක රතුපාට පොවා
යශෝදරාවෝ වගුරන කඳුළැළි
මහ සයුරට මුහුවෙලා ගියා

මිලානවී සිත සිඳී සෙනේ ගඟ
භවයෙන් භවයට පෙරුම් පුරාගන
නිවන් මගට යන දොරටු විවර වී
නිවන පසක් වේවා
භව සයුරෙන් සත එතෙර කරන්නට
නෞකාවක් වේවා

මිරිගුව නලියන භවඳුරු කතරක
මං විරසකවී සරණත් අයදින
අසරණවූ සත දුකින් මුදන්නට
මංපෙත් හෙලිවේවා
යශෝදරාවෝ ඔබේ දෙපා ළඟ
දුහුවිල්ලක් වේවා

- ලිහිණියේ

කලු වළාකුළු බිදෙනා
රළු සුළං ඉකි බිඳිනා
මේ වාරකං කාලේ
මැකී නිමවෙයි මහා වැහි කලුවේ

රැළි පෙරළි පෙරළි නැගෙනා
සැඩ මුහුඳ වෙරලේ හැපෙනා
ගිගුම් ලෙලවා අකුණු පුපුරණා
චණ්ඩ මාරුත
හැමදාම නෑ වාරකං සයුරේ

ජල තරඟ මතුවී නැගෙනා
යළි සැණින් ගිලිහි බිදෙනා
සයුර කළඹා නැගුණු පිලිගඳ
සැණින් මතුවී
හමාගෙන යයි දුරින් දුර සුළගේ

● අවසන් ගමන

මෑණියනේ ඔබෙ දෙපා වැළඳගෙන
සමුගත් ඔබගේ එකම පුතා
කසාවතක් හැඳ පෙර දවසේ
අනිත ලෝ දම ලොවට දෙසූ දා
ඔබට මතක නැතිදෝ

මළහිරු බසිනා සැන්දෑ යාමේ
නිසළ සිරුර මත ඔබගේ
මතක වතක් අල්ලාගෙන සිටිනා
දූ දරුවන්ගෙන් වෙන්වී යන්නේ
නිවන් පුරද අම්මේ

කණා කොක් රැළ ඉගිලෙන හැන්දෑවේ
පඩු පාටින් දිලෙනා අහසේ
සුදු පාවඩ මත සන්සුන් ගමනින්
ගිමන හලින් ඔබ පිටවී යන්නේ
නිවන් පුරද අම්මේ

• මිරිගුව

හිරු මියැදෙන විට සැන්දෑ අහසේ
සයුරේ තනිවුණු ඔරුවක් සේ
පැතුමන් බොඳවී අඳුරෙ ගිලෙනවා
සයුරේ නැගි පෙන බුබුලක් සේ

සියහිමි සිපගෙන සෙනෙහස පුදනා
දෙනයන රැවටූ සයුර නුඹයි
මළහිරු දහරේ නිසලව වැතිරී
සයුර වැළඳගත් අහස මමයි

පෙනපිඩු නංවා දියඹට ඇදෙනා
සසළව රඟදෙන සයුර නුඹයි
පෙරලෙන රැළිමත ඔහේ ඇදී යන
රුවළ ඉරී ගිය ඔරුව මමයි

● කසාවත

කැණිමඩලට ගිණිගෙන ඇවිලෙද්දී
අගහිගකම් ඇතිවුණා තමයි
අප්පච්චියේ නුඹ මා හැරදා ගිය
අඳුරු දවස අද වගේ මතකයි

දෙනෙතේ බොඳවුණු කඳුළැලි සගවා
මම හැඩුවා මුළු ලොවට හොරෙන්
වෛර කරන් නෑ අප්පච්චියෙ මම
නිවන් දකින තුරු සංසාරෙන්

රෑ තරු අවදිව හිනැහෙන යාමේ
බුදුන් දෙසු බණ කන වැකුනා
කසාවතට මම දන් දුන් දවසේ
අප්පච්චියේ නුඹෙ පවු ගෙවුණා

● පන් පැදුර

රැවල් ඔරු එලි ඈත මුහුදේ
දුරින් දිලෙනා රෑ
හිමියනේ .....
සඳ ඇවිත් ගෙට වැතිරිලා
ඉරුණු පන් පැදුරේ

පිපෙන්නට වෙර දරණ කැකුළක්
කිරි ඉද්ද පඳුරේ
නැවුම් සුළඟින් ඉපිළී
විසුරුවා පිණි සෙමින් විකසිතවේ

නිදිවරා මුළු රැයම සැතපෙන
ඉරුණු පන් පැදුරේ
රටා දහසක් මතුවී
පෙනෙනවා මට මගේ හිමි සඳුනේ

- අම්මයි මමයි

තුන්සිත පැහැදෙන සුදු වැලි මලුවේ
ඔබ අත අරගන බාලවියේ
මුනිදු පුදන්නට දෙපා නැගුහැටි
සිහිවේ අදවාගේ
දු දරුවන්ගේ පියෙකු වුණත් මා
ඔබේ පුතුයි අම්මේ

උතුරු සළුව උරහසින් දරාගන
දෙපා නැගු ඒ අඩිපාරේ
සිල් සුවඳින් තවමත් නැහැවේ
දු දරුවන්ගේ පියෙකු වුණත් මා
ඔබේ පුතුයි අම්මේ

දරු සෙනෙහස හදවතින් දරාගන
දිවිබර උසුලන සංසාරේ
ඔබ දැකුමෙන් සිත දුකින් මිදේ
දු දරුවන්ගේ පියෙකු වුණත් මා
ඔබේ පුතුයි අම්මේ

● අසම්මතය

අසම්මතයේ පෙම්වතුන් වී
නිල් නුවන් කඳුලින් වසා
පියනැගූ ඒ මාවතේ අග
ඉරක් සේ ඔබ බොඳ වෙලා

අපට පිටුපා අපේ සෙවනැළි
දුරින් දුර යයි පා වෙලා
කඳුළ සැනසුම තුරුළු කරගෙන
මගේ හදවත තනිවෙලා

බිමට බරවුණු මගේ කඳුළැලි
හඩන්නට පෙර ඉකිගසා
නුවන් පිසදා හැරී බැලූ සඳ
අනන්තෙට ඔබ යා වෙලා

● තනි තරුව

සඳ පහන් මැකී ගිය රැයෙහි දිලී
හිනැහෙණු ඇයි තනි තරුවේ
පුන් සඳක් නැගී යළි මැකී ගිහින්
ගණ අඳුරුයි මගේ ලොවේ

සඳ එළිය අරන් තරු පොකුරු ගණන්
හිනැහුණු ඒ පෙර දවසේ
සඳ මැකී ගිහින් මට බොහෝ දුරින්
හිනැහෙන්නද මා කෙලෙසේ

මුළු ලොවට හොරෙන් හිනැහෙන්න ඉතින්
මා හඩවා තනි තරුවේ
නෑ යළිත් වරක් සඳ නැගෙනු ඉතින්
මගේ මිය ගිය සිත් අහසේ

## ● රත් පියුම්

ගිම්හානේ මහලුව ගිය
සොලොස් කළා පිරි පුරහඳ
සිරියහනේ දැදිරි වෙවී අඳුර මකනවා
ඉරබටු තරුවේ එළියෙන්
දිලිසෙන රත් පියුම් කැකුළු
අරුණට පෙර පුබුදන්නට පෙරුම් පුරනවා

කළුවර ගිලගෙන සැඟවෙන
සෙවනැළි අතරින් අඳුරේ
ලියකම් කළ ඇඳවියලේ සිරි නරඹනවා
ගහකොළ මල් මැලවී යන
ගිම්හානය ගෙවෙනාතුරු
ඉරබටු තරු එළිය ඇවිත් තනිය මකනවා

දවසින් දවසට දියවෙන
සොළොස් කලා පිරි පුරහඳ
අමාවකේ ඝණ අඳුරට මුහුවී යනවා
නව දළු මල් යළි පිබිදී
වසන්තයේ අරුණට පෙර
දිලිසෙන රත් පියුම් කැකුළු විකසිත වෙනවා

● ලොව නිදිගත් රෑ

ලොවම නිදන මා නොනිදන
සඳ එළියට දුක මුමුණන
නිසළ මේ රැයේ
සිත් අහසට පහන් තරුව
වන්න ඔබ මගේ

ක්ෂිතිජ ඉමේ ඈත දුරක
හුදෙකලාව වෙන්වී හිඳිනා
පහන් තරුව සේ ඔබ මට
සිනාසෙන්න නිල් නෙතු විහිදා

පහන් නොවන සීත රැයක
ඔබයි මමයි වෙන්වී හිඳිනා
නෙතින් නෙතග දොඩමලු වෙමු
සඳයි තරුයි සේ අප දෙදෙනා

● වියපත් නොවූ සෙනෙහස

තරණයට මහගිරි දඹේ
දෑත් වාරුව ඔබ තමයි
මග ගෙවා ආ දුර ජීවිතේ
සිනා කඳුළැලි අපමණයි

වහල ගිලිහුණු මහළු ගොන් ගැල
අදින සඳ මඟ කුර ගගා
පාර පෙන්වයි ඔබේ දෙනයන
පහන් ටැඹ සේ ගොළු වෙලා

වැලට බරනැති වැලේ පලවැල
දරාගන සිටියද මෙමා
වෙළි දැවටුණු තුරුහිසයි නුඹ
මහා මෙර සේ නොසැලෙනා

● නුඹයි ඒ අම්මා

සැදෑ අහසේ ගිලී දිදුලන
නීල තරුකැට දෙකක් සේ
ඔබේ නෙතුයුග සැලේ මා සිත
නිවා දාහය නොනිම් මේ සසරේ

ඉමක් නොපෙනෙන නීල අහසේ
දසත විසිරුණු පුංචි තරුසේ
ඔබේ හසරැළි නිවයි දුක්ගිනි
සිහිනයක් වී මගේ තනි යහනේ

විරාගික වූ ප්‍රේම ගීතය
සීත හිමගිර වළාවක්සේ
මිහිරි ස්වරයෙන් වැයේ මා සිත
මගේ සිතුවිලි තනිවෙනා මොහොතේ

● ප්‍රිය දර්ශනී

එදා පෙම්වතෙකි මා අද මගියෙකි
එකම වීදියේ මේ නගරේ
දහසක් නෙතුයට සැඟවී පෙම්කළ
ඔබ මා කොතැනද අද දවසේ

ගහකොළ නිහඬව සිහිනෙක සැතපෙයි
මා අසරණ කර මතක ලොවේ
මේ මහ නගරේ වීදි අතර ඒ
ගෙවූ අතීතය සිතට නැගේ

පාළු වීදියේ තනිකම අතරේ
මතකය ඉකිබිඳ හඬන පැයේ
ප්‍රියේ දර්ශනී කොහේද ඔබ අද
මුළු නුවරම මළ ගමක් වගේ

## ● උඳුවප් සීතල

තුරු සෙවනැළියට සිසිළස විඳිමින්
හිනැහුණු කාලය මා ඔබ සමඟින්
ගෙවුණු අතීතය යළි සිහි කරමින්
උඳුවප් සීතල ආයෙම ඇවිදින්

බලාපොරොත්තුව යළි දැළු දමමින්
ඔබ එනවාදැයි පෙරමඟ බලමින්
ගිලන් මගේ සිතුවිලි පණ ගසමින්
වාරුනගා ඇවිදියි ඔබ සොයමින්

අතීත සැමරුම් මා හද දවමින්
සීතල කාලය ගෙවී ගියාදෙන්
තවත් කොපමණක් කල් මේ විලසින්
විඳවන්නට වේවිද මට තනියෙන්

● මැයි 01

වසා දොරගුළු දමා සිරකර මරා දැමූ අප ප්‍රේමයේ
අඳුරු සෙවනැළි අදත් දඟළයි එදාමෙන් නෙත් මානයේ
සුවෙන් සැතපෙන සොඳුරු සැමරුම් වැලිතලා යට කාලයේ
දොලොස් වසරක් මැරී ඉපදෙයි පළමු දින මැයි මාසයේ

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික  පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම  ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට
පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01